# ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
# இலங்கை பொலிஸ் திணைக்களம்
# Sri Lanka Police Department

## කාර්ය සාධන වාර්තාව
## செயலாற்றுகை அறிக்கை
## Performance Report

## 2015

# කාර්ය සාධන වාර්තාව

## 2015

**ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව**



## දැක්ම

අපරාධ සහ ප්‍රචණ්ඩත්වය
පිළිබඳව බියකින් තොරව
විශ්වාසයෙන් යුතුව
ජීවත් වීමට හැකි සාමකාමී
පරිසරයක් බිහි
කිරීම.

## මෙහෙවර

සැමට සමාන,
කිසිවකුටත් අගතියක්
සිදුකිරීමකින් තොරව
අපරාධ සහ
ත්‍රස්තවාදය
වැළැක්වීමටත්, සාමය
ආරක්ෂා කරගැනීමටත්,
දිවයිනේ නීතිය
පවත්වාගෙන යාමටත්,
එය ක්‍රියාත්මක කිරීමටත්
ශ්‍රී ලංකා පොලීසිය
විශ්වාසයෙන් යුතුව ක්‍රියා
කිරීමට ඇප කැප වී සිටියි.



## පොලිස්පතිතුමාගේ පණිවුඩය

රටේ නීතිය සහ සාමය ආරක්ෂා කරමින් සියළුම පුරවැසියන්ට අපරාධ බියකින් තොරව ජීවත්වීමේ වටපිටාවක් නිර්මාණය කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ ඒකායන පරමාර්ථයයි. කවර විවේචන එල්ල වුවද පොලිසිය එම අභියෝගාත්මක පරමාර්ථය සපලකර ගැනීම සඳහා උරදී සිටී.

නූතන තාක්ෂණික දියුණුවත් සමග අපරාධකාරීත්වයද ප්‍රබලත්වයට පත්ව තිබේ. එම අපරාධකාරීත්වයට වැට බැඳීමට නම් අපරාධ විමර්ශනය ඉහළ මට්ටමක පවත්වා ගත යුතුය. ඇඟිලි සලකුණු පරීක්ෂාව සඳහා දියුණු තාක්ෂණය උපයෝගී කර ගනිමින්ද අපරාධ විමර්ශනයෙහිලා නිළධාරීන්ට සෑම අතින්ම න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දෙමින්ද සමීප රූප ආවේක්ෂණ කැමරා තාක්ෂණය පෘථුල ලෙස භාවිතා කරමින්ද ඒ සියල්ල අතරතුර මහජන සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් කරමින්ද පොලිස් දෙපාර්තමේන්තුව 2015 වර්ෂය තුළ අපරාධ මර්දනය සඳහා විශාල කාර්යභාරයක් ඉටුකොට තිබේ. බල අපරාධ පෙර වසරට සාපේක්ෂව අඩුවීම එහි සෘජු ප්‍රතිඵලයක් ලෙස ගත හැකිය.

ළමයින්ට එරෙහි අපාරධ විසඳීමේ ප්‍රගතිය පොලිස් සේවයේ කාර්යශූරත්වය පැහැදිලි කරන තවත් සාධකයකි. කාන්තාවන්ට එරෙහි අපරාධවල අඩුවීමක් පෙන්නුම්කර ඇති අතර, විසඳීමේ ප්‍රගතිය ඉහළ මට්ටමකට පත්ව ඇත. පෙර වර්ෂවල මෙන්ම මෙම වසරේද විවිධ පැමිණිලි විසඳීම ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගෙන ඇත.

ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් පොහොසත් සමාජයක් බිහි කිරීම සඳහා වන අපගේ අභිප්‍රාය, නීති විරෝධි මත්ද්‍රව්‍ය සහ මත්පැන් සම්බන්ධයෙන් කරනු ලැබ ඇති වැටලීම් මගින් සනාථ වේ. 2015 වර්ෂයේ විනාශකාරී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ඉහළ ගොස් ඇති අතර, ඒ සඳහා හේතු වුයේ සුක්ෂමව කරන ලද වැටලීම්ය.

පොලිස් රාජකාරි තුළින් සෑම පාර්ශවයක්ම තෘප්තිමත් කළ නොහැකි වුවද නීතියට අනුකූලව සැමට සාධාරණය ඉටු කිරීමට පොලිසිය බැඳී සිටී. අඩුපාඩු, අතපසුවීම්, දුර්වලතා කවර සේවයකට වුවද පොදු ලක්ෂණ වේ. එසේ වුවද 2015 වර්ෂයේ සිදු කළ පොලිසිය පිළිබඳ මහජන ආකල්ප විමසීමේ සමීක්ෂණයේ ප්‍රතිඵල වලට අනුව පෙර වර්ෂයේ 59% ක් වු පොලිස් මහජන සම්බන්ධතාවය 2015 වර්ෂය අවසාන වන විට 79% දක්වා වර්ධනය වී ඇත. ඇතැම් ප්‍රදේශවල අපරාධයකට ගොදුරු වීමේ හැකියාව 30% සිට 05% දක්වා අඩුවී ඇත. මේ සියල්ල පොලිස් නිළධාරියාගේ කැපවීම මත අත්වූ ප්‍රතිඵල වේ.

කම්කටොළු, විවේචන මෙන්ම ප්‍රශංසාද මහජන සේවය හා බැඳී ඇති සාධක වේ. මේ කවරාකාරයෙන් වුවද, මහජනතාවගෙන් ලැබෙන සහාය අප අරමුණු හා පරමාර්ථ සාධනය සඳහා මෙහෙයවනු ලැබ ඇත. ඉදිරියටත් එම සහාය අත්‍යාවශ්‍ය බව කිව යුතුය.

2015 වසරේ ලද ජයග්‍රහණ මෙන්ම බාධක ද පන්නරය කොට ගෙන තවදුරටත් නීතිගරුක හා සාමකාමී සමාජයක් නිර්මාණය කිරීම සඳහා ඔබ අප සැම දෙනම අදිටන් කර ගනිමු.

**එන්.කේ. ඉලංගකෝන්**
**පොලිස්පති**

## පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

- මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාම
- මාර්ග ආරක්ෂාව හා රථවාහන පාලනය
- අපරාධ පාලනය හා වැළැක්වීම
- ප්‍රභූ ආරක්ෂාව
- පරිසර ආරක්ෂණ කටයුතු සහ ආපදා අවස්ථාවන්හීදී අදාළ අංශ වෙත සහාය ලබාදීම
- කැරළි හා දූෂණ මර්දනය සහ විවිධ පැමිණිලි විසඳීම
- පොලිස් නිෂ්කාශන හා පසුබිම් වාර්තා අදාළ අංශ සහ පුද්ගලයින් වෙත නිකුත් කිරීම

## විශේෂ කාර්ය බලකායේ කාර්යභාරය


- අපරාධ මර්දන හදිසි මෙහෙයුම් සිදු කිරීම.
- දෙස් විදෙස් ප්‍රභූ ආරක්ෂක රාජකාරි.
- සෝදිසි හා බෝම්බ නිශ්ක්‍රීය මෙහෙයුම් සිදු කිරීම.
- නීතිය හා සාමය ආරක්ෂා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුවට සහාය දීම.
- ස්වාභාවිකව හෝ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි අවස්ථා වලදී ජන ජීවිතය යථා තත්වයට පත් කිරීමට සහාය වීම.
- සමාජ විරෝධී අවකල් ක්‍රියා මැඩපැවැත්වීමට කටයුතු කිරීම. (නීති විරෝධී මත් කුඩු ජාවාරම, ගංජා ජාවාරම වැනි දෑ)
- ස්වභාව ධර්මයේ දායාදයන් සුරැකීම හා මිනිසා විසින් සිදු කරනු ලබන පාරිසරික විනාශයන් වැළැක්වීමට කටයුතු කිරීම.
- ජීවිතාරක්ෂක මෙහෙයුම් සිදු කිරීම.

# පෙළගැස්ම


| | ක්ෂේත්‍රය | පිටු අංකය |
|---|---|---|
| 01. | නිළ ධුරාවලිය සහ සේවක සංඛ්‍යාව | 01 - 04 |
| 02. | පොලිස් දෙපාර්තමේන්තුවේ සංවිධානාත්මක ව්‍යුහය | 05 - 09 |
| 03. | අපරාධ මර්දනය සහ විමර්ශනය | 10 - 10 |
| 04. | කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ | 11 - 11 |
| 05. | විවිධ පැමිණිලි විමර්ශනය | 12 - 12 |
| 06. | මත්පැන් සහ මත්ද්‍රව්‍ය නිවාරණය | 13 - 15 |
| 07. | දූෂණ මර්දන සහ ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධ වැටලීම් | 16 - 17 |
| 08. | රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව | 18 - 18 |
| 09. | වෙනත් මහජන සේවාවන් | 19 - 21 |
| 10. | මානව සම්පත් සංවර්ධනය | 22 - 25 |
| 11. | භෞතික සම්පත් සංවර්ධනය | 26 - 27 |
| 12. | සමස්ථ මූල්‍ය ප්‍රගතිය | 28- 29 |
| 13. | 2015 වර්ෂයේ කාර්ය සාධනය සැකෙවින් | 30 - 30 |

# 01. නිළ ධුරාවලිය සහ සේවක සංඛ්‍යාව

## 1.1. නිළ ධුරාවලිය



## 1.2 සේවක සංඛ්‍යාව ( සාමාන්‍ය පොලිසිය )

වගු අංක 01

| 2015.12.31 දිනට සේවක සංඛ්‍යාව ( සාමාන්‍ය පොලිසිය ) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නිලය | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතු කාර්ය මණ්ඩලය | සේවය හැරගිය ප්‍රමාණය | සේවය අත්හිටවූ ප්‍රමාණය | සත්‍ය ලෙසම සේවයේ යෙදී සිටින ප්‍රමාණය | පුරප්පාඩු | උපයෝගී | සත්‍ය ලෙසම පවතින පුරප්පාඩු |
| පොලිස්පති | 1 | 1 | | | 1 | | | 0 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 12 | 12 | | | 12 | 0 | | 0 |
| නියෝජ්‍ය පොලිස්පති | 46 | 24 | | 2 | 22 | 22 | | 22 |
| ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 169 | 79 | 1 | 2 | 76 | 90 | 3 | 87 |
| කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 1 | 0 | | | 0 | 1 | | 1 |
| පොලිස් අධිකාරී | 162 | 24 | | 1 | 23 | 138 | | 138 |
| කාන්තා පොලිස් අධිකාරී | 2 | 0 | | | 0 | 2 | | 2 |
| සහකාර පොලිස් අධිකාරී | 314 | 303 | | 2 | 301 | 11 | 9 | 2 |
| කාන්තා සහකාර පොලිස් අධිකාරී | 15 | 10 | | | 10 | 5 | | 5 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | 780 | 721 | 5 | 12 | 704 | 59 | 15 | 44 |
| කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක | 15 | 15 | | | 15 | 0 | | 0 |
| පොලිස් පරීක්ෂක | 2699 | 2178 | 15 | 38 | 2125 | 521 | | 521 |
| කාන්තා පොලිස් පරීක්ෂක | 266 | 214 | 1 | 2 | 211 | 52 | | 52 |
| උප පොලිස් පරීක්ෂක | 5312 | 5001 | 21 | 58 | 4922 | 311 | 81 | 230 |
| කාන්තා උප පොලිස් පරීක්ෂක | 642 | 589 | 3 | | 586 | 53 | 2 | 51 |
| උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) | 125 | 119 | | | 119 | 6 | | 6 |
| මහසැරයන් | 100 | 6 | 1 | | 5 | 94 | | 94 |
| මහසැරයන් රියදුරු | 50 | 1 | | | 1 | 49 | | 49 |
| පොලිස් සැරයන් | 15315 | 13454 | 106 | 113 | 13235 | 1861 | | 1861 |
| කාන්තා පොලිස් සැරයන් | 1800 | 1233 | 6 | 1 | 1226 | 567 | | 567 |
| පොලිස් කොස්තාපල් | 43324 | 41242 | 1976 | 521 | 38745 | 2082 | | 2082 |
| කාන්තා පොලිස් කොස්තාපල් | 8468 | 6106 | 293 | 4 | 5809 | 2362 | | 2362 |
| පොලිස් සැරයන් රියදුරු | 700 | 425 | 2 | 4 | 419 | 275 | | 275 |
| පොලිස් කොස්තාපල් රියදුරු | 3500 | 3230 | 143 | 12 | 3075 | 270 | | 270 |
| **එකතුව** | **83818** | **74987** | **2573** | **772** | **71642** | **8831** | **110** | **8721** |

මූලාශ්‍රය - පිරිස් හා ලේඛන කොට්ඨාසය

## 1.3 සේවක සංඛ්‍යාව (විශේෂ කාර්ය බලකාය)

වගු අංක 02

| 2015.12.31 දිනට සේවක සංඛ්‍යාව ( විශේෂ කාර්ය බලකාය ) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නිලය | අනුමත කාර්ය මංඩලය | සේවයේ නියුතු කාර්ය මංඩලය | සේවය හැරගිය ප්‍රමාණය | සේවය අත්හිටවූ ප්‍රමාණය | සත්‍ය ලෙසම සේවයේ යෙදී සිටින ප්‍රමාණය | පුරප්පාඩු | උපසේවා | සත්‍ය ලෙසම පවතින පුරප්පාඩු |
| නියෝජ්‍ය පොලිස්පති | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 8 | 4 | 0 | 0 | 4 | 4 | 0 | 4 |
| පොලිස් අධිකාරී | 7 | 0 | 0 | 0 | 0 | 7 | 0 | 7 |
| සහකාර පොලිස් අධිකාරී | 34 | 23 | 0 | 0 | 23 | 11 | 0 | 11 |
| කාන්තා සහකාර පොලිස් අධිකාරී | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | 67 | 67 | 2 | 0 | 65 | 0 | 0 | 0 |
| කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක | 2 | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| පොලිස් පරීක්ෂක | 270 | 213 | 9 | 2 | 202 | 57 | 6 | 51 |
| කාන්තා පොලිස් පරීක්ෂක | 7 | 6 | 0 | 0 | 6 | 1 | 0 | 1 |
| උප පොලිස් පරීක්ෂක | 812 | 723 | 41 | 3 | 679 | 89 | 1 | 88 |
| කාන්තා උප පොලිස් පරීක්ෂක | 13 | 13 | 1 | 0 | 12 | 0 | 0 | 0 |
| උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) | 4 | 4 | 0 | 0 | 4 | 0 | 0 | 0 |
| මහසැරයන් | 37 | 1 | 0 | 0 | 1 | 36 | 0 | 36 |
| මහසැරයන් රියදුරු | 8 | 0 | 0 | 0 | 0 | 8 | 0 | 8 |
| පොලිස් සැරයන් | 1625 | 1315 | 12 | 1 | 1302 | 310 | 0 | 310 |
| කාන්තා පොලිස් සැරයන් | 27 | 20 | 0 | 0 | 20 | 7 | 0 | 7 |
| පොලිස් කොස්තාපල් | 6999 | 6327 | 1196 | 57 | 5077 | 672 | 0 | 672 |
| කාන්තා පොලිස් කොස්තාපල් | 163 | 141 | 15 | 1 | 125 | 22 | 0 | 22 |
| පොලිස් සැරයන් රියදුරු | 64 | 57 | 0 | 0 | 57 | 7 | 0 | 7 |
| පොලිස් කොස්තාපල් රියදුරු | 577 | 584 | 107 | 4 | 473 | -7 | 0 | -7 |
| **එකතුව** | **10726** | **9501** | **1383** | **65** | **8053** | **1232** | **7** | **1225** |

මූලාශ්‍රය - පිරිස් හා ලේඛන කොට්ඨාසය


## 1.4 සේවක සංඛ්‍යාව ( සහායක සේවා )

වගු අංක 03


| 2015.12.31 දිනට සේවක සංඛ්‍යාව (සහායක සේවා) | | | |
|---|---|---|---|
| නිලය | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතු කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
| නියෝජ්‍ය පොලිස්පති | 2 | 0 | 2 |
| ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි | 45 | 0 | 38 |
| පොලිස් අධිකාරි | | 1 | |
| සහකාර පොලිස් අධිකාරි | | 6 | |
| ප්‍රධාන පොලිස් පරික්ෂක | 422 | 4 | 322 |
| පොලිස් පරික්ෂක | | 26 | |
| උප පොලිස් පරික්ෂක | | 70 | |
| කාන්තා ප්‍රධාන පොලිස් පරික්ෂක | 102 | 0 | 55 |
| කාන්තා පොලිස් පරික්ෂක | | 17 | |
| කාන්තා උප පොලිස් පරික්ෂක | | 30 | |
| පොලිස් සැරයන් | 6748 | 193 | 5750 |
| පොලිස් කොස්තාපල් | | 805 | |
| කාන්තා පොලිස් සැරයන් | 246 | 37 | 56 |
| කාන්තා පොලිස් කොස්තාපල් | | 153 | |
| **එකතුව** | **7565** | **1342** | **6223** |

මූලාශ්‍රය - පිරිස් හා ලේඛන කොට්ඨාසය


# 02 පොලිස් දෙපාර්තමේන්තුවේ සංවිධානාත්මක ව්‍යුහය




## 2.1. පොලිස් ප්‍රාදේශීය කොට්ඨාස ව්‍යුහය




## 2.2. පොලිස් ක්‍රියාකාරී කොට්ඨාස




නි.පොප පොලිස් මූලස්ථානය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය
පොලිස් මූලස්ථානය
ඔහජන සම්බන්ධතා කොට්ඨාසය
සංඛ්‍යාලේඛන කොට්ඨාශය
පර්යේෂණ හා සැළසුම් කොට්ඨාශය
පරීක්‍ෂණ හා පුනරීක්‍ෂණ කොට්ඨාශය
කළමනාකරණ සංවර්ධන කොට්ඨාශය
නි.පො.ප. සුභසාධක
සුභසාධක කොට්ඨාසය
නි.පොප. අපරාධ දිසාව
අපරාධ කොට්ඨාශය
ළමා හා කාන්තා කාර්යාංශය
මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය
අපරාධ වාර්ථා කොට්ඨාසය
පොලිස් සංචාරක කොට්ඨාසය
නි.පොප. ප්‍රවර්ථන දිසාව
ගොඩනැගිලි කොට්ඨාශය
සැපයුම් කොට්ඨාශය
දේපළ කලමණාකරණ කොට්ඨාසය
වෛද්‍ය කොට්ඨාසය
නි.පොප ක්‍ෂේත්‍ර බළකා මූලස්ථානය
පරිසර කොට්ඨාසය
ක්‍ෂේත්‍ර බලකා මූලස්ථානය
ක්‍රීඩා කොට්ඨාශය
නි.පොප රථවාහන දිසාව
රථවාහන මූලස්ථානය
අධිවේගී මාර්ග කොට්ඨාශය
නි.පොප. ත්‍රස්ත විමර්ශන දිසාව
රාජ්‍ය බුද්ධි සේවාව
ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය
නි.පොප ප්‍රවාහන හා සංදේශ දිසාව.
ප්‍රවාහන කොට්ඨාශය
සංදේශ කොට්ඨාශය
පොලිස්පති අණදෙන මැදිරිය
නි.පො.ප. බස්නාහිර දකුණ
පාර්ලිමේන්තු කොට්ඨාසය
නි.පො.ප. මහනුවර
නිල සුනඛ කොට්ඨාසය
නි.පො.ප. අගමැති ආරක්ෂක දිසාව
අගමැති ආරක්‍ෂක කොට්ඨාශය
නි.පොප. විශේෂ ආරක්‍ෂක දිසාව
ඇමති ආරක්‍ෂක කොට්ඨාශය
අධිකරණ ආරක්‍ෂක කොට්ඨාශය
තානාපති ආරක්‍ෂක කොට්ඨාශය
නි.පො.ප. කොළඹ දිසාව
අස්වාරෝහක කොට්ඨාසය
කොළඹ අපරාධ කොට්ඨාසය
වංචා විමර්ශන කොට්ඨාසය
බ/ප බුද්ධි කොට්ඨාසය
පොලිස් නාවික කොට්ඨාසය
නාගරික රථවාහන කොට්ඨාසය

## 2.3. විශේෂ කාර්ය බලකායේ ව්‍යුහය




මූලාශ්‍රය - විශේෂ කාර්ය බලකාය

# 03. අපරාධ මර්දනය සහ විමර්ශනය

## 3. 1. බල අපරාධ

වගු අංක 04 ට අනුව 2015.12.31 න් අවසන් වූ වසර තුළ වාර්තාවූ බල අපරාධ සංඛ්‍යාව 40,188 කි. ඉන් 23,575 ක් විසඳා ඇති අතර එය 59 % ක ප්‍රතිශතයකි. එමගින් පසුගිය වසරට සාපේක්ෂව අපරාධ විසඳීමේ ප්‍රගතියක් පෙන්නුම් කෙරේ.2014 වාර්තා වූ බල අපරාධ ප්‍රමාණය වන 50962 ක අපරාධ ප්‍රමාණය 40188 දක්වා අඩුකර ගැනීමට සමත් වී තිබේ. බරපතල අපරාධ විසඳීමේ ප්‍රගතිය සහ එම අපරාධ විශාල ප්‍රමාණයකින් අඩුකර ගැනීමට හැකිවීම පොලිස් දෙපාර්තමේන්තුව මෙන්ම සමාජයක් ලෙසද අප ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

වගු අංක 04

| අපරාධවර්ගය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| බල අපරාධ | 55,349 | 32,791 | 50,962 | 29,396 | 40188 | 23575 |
| සුළු වැරදි පුද්ගලයින්ට එරෙහි | 45,282 | 33,094 | 42,368 | 30,561 | 43870 | 30292 |
| සුළු වැරදි දේපලවලට එරෙහි | 26,138 | 15,703 | 21,827 | 11,691 | 30085 | 14407 |
| එකතුව | **126,769** | **81,588** | **115,157** | **71,648** | **114143** | **68274** |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය



අපරාධ ස්ථානයක් පරීක්ෂා කරන අවස්ථාවක්

## 3.2. පුද්ගලයින්ට හා දේපළවලට එරෙහි සුළු වැරදි

වගුවට අනුව මෙම වැරදි වාර්තාවීම් 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ යම් වර්ධනයක් පෙන්නුම් කරයි. පුද්ගලයින්ට හා දේපළවලට එරෙහි වැරදිවල විසඳීම් ප්‍රතිශතය 2015 වසරේ පිළිවලින් 69% ක් සහ 48% ක ප්‍රතිශතයක් පෙන්නුම් කරයි.

## 04. කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ

කාන්තාවන්ට සහ දූදරුවන්ට යහපත් සමාජ වටපිටාවක් ගොඩ නැගීම කවර සමාජයක හෝ ප්‍රගමණයට අත්‍යාවශ්‍ය සාධකයකි. දෙපාර්ශවයටම නිරුපද්‍රිත වටපිටාවක් තුළ අපරාධ බියකින් තොරව ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය විශාල පරිශ්‍රමයක් දරනු ලබයි. 2015 වසරේ ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි අපරාධ වාර්තාවීම් සහ විසඳීම් පිළිබඳ තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක 05

| අපරාධ වර්ගය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| ළමයින්ට එරෙහි අපරාධ | 6,040 | 2,109 | 5,868 | 1,648 | 5911 | 5102 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 8,320 | 4,672 | 8,434 | 4,399 | 8288 | 4579 |
| එකතුව | **14,360** | **6,781** | **14,302** | **6,047** | **14199** | **4681** |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය

වගුවට අනුව ළමයින්ට එරෙහි අපරාධ 2013 සිට ක්‍රමානුකූලව අඩුවීමක් පෙන්නුම් කොට ඇති අතර, 2015 වසරේ එහි සුළු ඉහළයාමක් පෙන්නුම් කෙරේ. එසේ වුවද 2015 වර්ෂයේ විසඳීමේ ප්‍රගතිය ඉතා ඉහළ අගයක් ගෙන ඇත. එය 86% ක ප්‍රතිශතයකි. 2014 වසරට සාපේක්ෂව ළමයින්ට එරෙහි අපරාධ විසඳීමේ විශාල ප්‍රගතියක් පෙන්නුම් කිරීමට පොලිසිය සමත්ව ඇත.

2014 වර්ෂයට සාපේක්ෂව කාන්තාවන්ට එරෙහි අපරාධ වලද අඩුවීමක් පෙන්නුම් කොට ඇති අතර, විසඳීමේ ප්‍රතිශතයද 55% ක මට්ටමක පවතී.

# 05. විවිධ පැමිණිලි විමර්ශනය

විවිධ පැමිණිලි යනු පොලිසියට මෙන්ම ජන ජීවිතයටද ඉතා තදින් බලපානු ලබන සාධකයකි. සුළු ආරවුලක් මුල් අවධියේදීම විසඳා ගැනීම ඉදිරියේදී සිදුවිය හැකි බරපතල අපරාධයක් වළක්වා ගැනීමකි. මෙම තත්වය සලකා ගෙන පොලිස් දෙපාර්තමේන්තුව විවිධ පැමිණිලි විමර්ශනයට ප්‍රමුඛතාවයක් දෙනු ලබයි. වගුවට අනුව 2015 වසරේ වාර්තාවූ විවිධ පැමිණිලි 1014812 කින් 1014291 ක් විසඳීමට පොලිසිය සමත්ව ඇත. එමෙන්ම පෙර වසර වලට සාපේක්ෂව විවිධ පැමිණිලි වල සීඝ්‍ර අඩුවීමක්ද දැකිය හැක. එමගින් පොලිසිය සතු සමථ කිරීමේ හැකියාවද මැනවින් පිළිබිඹු කොට ඇත.

වගු අංක 06

| විවිධ පැමිණිලි | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| | 1,046,024 | 1,044,465 | 1,065,648 | 1,063,413 | 1014812 | 1014291 |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය

# 06. මත්පැන් සහ මත්ද්‍රව්‍ය නිවාරණය

ලොව කවර ප්‍රදේශයක වුවද නීති විරෝධි මත්ද්‍රව්‍ය සහ මත්පැන් යනු මානව හා සමාජ ප්‍රගමණයට පවතින ප්‍රබලම බාධාවකි. 2015 වසරේ පොලිස් දෙපාර්තමේන්තුව නීති විරෝධි මත්ද්‍රව්‍ය මැඩලීම සඳහා විශාල වැටලීම් ප්‍රමාණයක් සිදුකොට ඇති අතර, සමාජයෙන් මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ වැඩ පිළිවෙල එමගින් වේගවත් කොට ඇත.

මෙම වැටලීම් වලදී විශේෂ කාර්ය බලකායේ සහායද ලබාගෙන ඇති අතර, වගු අංක 7,8,9,10 මගින් අදාළ තොරතුරු ඉදිරිපත් කොට ඇත.

### 6.1. සුරාව සම්බන්ධ වැටලීම්

වගුවට අනුව 2013 වසරේ සිට මේ දක්වා සුරාව සම්බන්ධ වැරදිවල අඩුවීමක් පෙන්නුම් කොට ඇති අතර විමර්ශන කාර්යයද වර්ධනය වී ඇත.

වගු අංක 07

| සුරාබදු වැරදි | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ |
| නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 8,529 | 8,125 | 7,041 | 6,576 | 8459 | 7999 |
| බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදන | 49 | 48 | 21 | 21 | 30 | 29 |
| නීති විරෝධි ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීම | 29 | 25 | 45 | 41 | 19 | 19 |
| නීති විරෝධි ලෙස ස්ප්‍රීතු වර්ග නිෂ්පාදනය හෝ පෙරීම | 344 | 302 | 712 | 689 | 665 | 624 |
| නීති විරෝධි ලෙස මත්පැන් විකිණීම හා ළඟ තබා ගැනීම | 85,655 | 82,436 | 82,042 | 79,386 | 83807 | 80897 |
| නීති විරෝධි මහ රා විකිණීම හා ළඟ තබා ගැනීම | 7,241 | 6,678 | 6,160 | 5,900 | 5392 | 5025 |
| බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිණීම හෝ ලීටර් 7.5 ට වඩා ළඟ තබා ගැනීම | 14,354 | 13,692 | 12,358 | 11,421 | 10019 | 9475 |
| බලපත්‍රයක් නොමැතිව බියර් වර්ග හා අනෙකුත් මත් පැන් වර්ග විකිණීම /විකිණීම සඳහා ළඟ තබා ගැනීම | 1,889 | 1,775 | 1,479 | 1,427 | 1593 | 1501 |
| නීති විරෝධි ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රීතු වර්ග ළඟ තබා ගැනීම හා විකිණීම | 487 | 474 | 545 | 540 | 355 | 343 |
| නීති විරෝධි මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා අනෙකුත් ස්ප්‍රීතු වර්ග/රජයේ අරක්කු ප්‍රවාහනය කිරීම (ලීටර් 7.5 ට වැඩි) | 351 | 341 | 355 | 336 | 252 | 237 |
| නීති විරෝධි මත්පැන්/ස්ප්‍රීතු වර්ග  මහ රා නිෂ්පාදනයට ගන්නා උපකරණ ළග තබා ගැනීම | 487 | 458 | 351 | 344 | 523 | 506 |
| සුරාබදු ආඥා පනත යටතට වැටෙන අනෙකුත් වැරදි | 5,188 | 4,844 | 3,681 | 3,553 | 2830 | 2601 |
| **එකතුව** | **124,603** | **119,198** | **114,790** | **110,234** | **113944** | **109256** |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය

## 6.2. නිද්‍රාජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම.

මේ යටතේ ප්‍රබල විනාශකාරී මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අත් අඩංගුවට ගෙන ඇති අතර විශේෂ කාර්ය බලකායේ සහායද ලබාගෙන මෙම වැටලීම් සිදු කොට ඇත. මේ සම්බන්ද තොරතුරු පහත වගු මගින් විග්‍රහ කොට ඇත.

වගු අංක 08

| නිද්‍රා ජනක ද්‍රව්‍ය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | | | 2014 | | | 2015 | | |
| | කි.ග්‍රෑ. | ග්‍රෑ. | මි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | ග්‍රෑ. | මි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | ග්‍රෑ. | මි.ග්‍රෑ. |
| **ගංජා** | 10361 | 336 | 365 | 10758 | 19 | 886 | 13253 | 55 | 225 |
| අබිං | - | 496 | 150 | - | 5 | - | - | 249 | 500 |
| **හෂීස්** | - | 274 | 5 | 1 | 95 | 107 | 4 | 187 | 630 |
| **හෙරොයින්** | 337 | 859 | 965 | 312 | 549 | 4 | 44 | 521 | 89 |
| මෝෆීන් | - | 112 | 130 | - | - | 90 | - | - | - |
| කොකේන් | - | - | - | - | 2 | 964 | 81 | 672 | 333 |
| **වෙනත්** | 139 | 700 | 185 | 46 | 852 | 961 | 166 | 751 | 909 |
| **එකතුව** | **10837** | **2777** | **1800** | **11117** | **1522** | **3012** | **13548** | **2435** | **2686** |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය

වගු අංක 09

| # | නිද්‍රාජනක ද්‍රව්‍ය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ |
| 1 | ගංජා | 45,921 | 44,651 | 46,884 | 45,997 | 57921 | 56747 |
| 2 | අබිං | 11 | 10 | 1 | 1 | 4 | 4 |
| 3 | හෂීස් | 10 | 10 | 752 | 660 | 19 | 15 |
| 4 | හෙරොයින් | 24,400 | 22,966 | 23,578 | 22,041 | 26991 | 26397 |
| 5 | මෝෆීන් | 12 | 12 | 2 | 2 | - | - |
| 6 | කොකේන් | 0 | 0 | 4 | 4 | 352 | 328 |
| 7 | වෙනත් | 3,029 | 3,029 | 3,145 | 3,007 | 4709 | 4355 |
| | එකතුව | **73,383** | **70,678** | **74,366** | **71,712** | **89996** | **87846** |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය

- **විශේෂ කාර්ය බලකාය මගින් සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම්**

වගු අංක 10

| අනු අංකය | නිද්‍රා ජනක ද්‍රව්‍ය | සිදුවීම් ප්‍රමාණය | අත් අඩංගුවට ගත් ප්‍රමාණය | අත් අඩංගුවට ගත් පුද්ගලයින් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | ගංජා | 264 | කි.ග්‍රෑම් 2,062.594<br>හේන් - අක්කර 145<br>පැළ 1,380,721 | 260 |
| 2. | හෂීස් | 00 | 00 | 00 |
| 3. | හෙරොයින් | 151 | ග්‍රෑම් 434.662 | 167 |
| 4. | වෙනත් (මදන මෝදක) | 05 | කි.ග්‍රෑම් 03.106 | 05 |
| 5. | අබිං | 00 | 00 | 00 |
| 6. | මෝෆීන් | 00 | 00 | 00 |
| 7. | කොකේන් | 00 | 00 | 00 |

මූලාශ්‍රය - විශේෂ කාර්ය බලකාය

## 07. දූෂණ මර්දන සහ ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධ වැටලීම්

සමාජ පර්යාය බිඳවැටීම සඳහා ප්‍රබල ලෙස බලපාන සමාජ විරෝධි ක්‍රියා ලෙස මේ ක්ෂේත්‍රයේ වැරදි හඳුන්වා දිය හැක. පොලිසියේ විමසිලිමත් බව හා කාර්යශූර බව මැනවින් ප්‍රකට වන වැටලීම් ලෙස මෙම දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධ වැටලීම් කැපී පෙනේ.

2013 වසරේ සිට 2015 දක්වා මේ ක්ෂේත්‍ර දෙකේම වැරදි වාර්තාවීම් කැපී පෙනෙන ලෙස අඩුවී ඇත. වගුවට අනුව 2015 වසරේ වාර්තාවූ දූෂණ වැරදි 1796 න් 1788 ක්ම විසඳීම මගින් 99% ප්‍රගතියක් අත්කර ගෙන ඇත. පෙර වසරේ එය 96% ප්‍රතිශතයකි.

ව්‍යවස්ථාපිත වැරදි වාර්තාවීම 46290 කි. ඉන් 43896 ක් විසඳා ඇති අතර, එය 94% ප්‍රතිශතයකි. මෙම වැරදි වලද පෙර වසර දෙකටම සාපේක්ෂව සීඝ්‍ර අඩුවීමක් පහත වගුව මගින් හඳුනා ගත හැකිය.

වගු අංක 11

| | වරද | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ |
| **1** | දූෂණ වැරදි (6) | **2724** | **2627** | **1921** | **1856** | **1796** | **1788** |
| **2** | ව්‍යවස්ථාපිත වැරදි | **73124** | **69541** | **54877** | **52998** | **46290** | **43969** |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය

### 7.1. විශේෂ කාර්ය බලකාය මගින් කරන ලද දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි වැටලීම්.

දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධ වැටලීම් වලදී විශේෂ කාර්ය බලකායේ නොමඳ සහායද පොලිසිය වෙත ලැබී ඇත. ඒ තුළින් මේ සම්බන්ධ වැටලීම් සාර්ථකව ඉටුකිරීමට හැකිවී ඇත. 2015 වර්ෂයේ විශේෂ කාර්ය බලකාය මගින් ක්‍රියාත්මක කරනලද වැටලීම් පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක 12

| අනු අංකය | වරද | සිදුවීම් ප්‍රමාණය | අත් අඩංගුවට ගත් ප්‍රමාණය | අත් අඩංගුවට ගත් පුද්ගලයින් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | කසල තේ | 29 | කි.ග්‍රෑම් 325,655.900 | 45 |
| 2. | ගවයින් ප්‍රවාහණය කිරීම | 31 | ගවයින් - 272 | 75 |
| 3. | පරිභෝජනයට නුසුදුසු මාංශ | 19 | කි.ග්‍රෑම් 3,460.900 | 57 |
| 4. | අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය | 23 | මෙරට නිෂ්පාදිත අවි - 16<br>රිවොල්වර - 02<br>ඩෙටනේටර් - 336<br>අත් බෝම්බ - 04<br>ෂොට් ගන් අවි කාට්‍රිජ - 07 | 26 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5. | නීති විරෝධී මැණික් ගැරීම | | 58 | කම්ප්‍රෙෂර් යන්ත්‍ර- 12<br>බැකෝ යන්ත්‍ර - 22 | 125 |
| 6. | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් | මත්පැන් | 256 | රජයේ මත්පැන් - 454 ¾<br>නීති විරෝධී - 16,002 ½ | 284 |
| | | සිගරට් | 25 | 201,384 | 26 |
| 7. | වෙනත් | | 38 | -- | 81 |

මූලාශ්‍රය - විශේෂ කාර්ය බලකාය







දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි යටතේ කළ වැටලීම් සම්බන්ධ ඡායාරූප

# 08. රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව

මහා මාර්ගය රථ වාහන භාවිතා කරන්නන්ට මෙන්ම පදිකයින්ටද ආරක්ෂිත ස්ථානයක් බවට පත්කිරීම වාර්තමානයේ අභියෝගාත්මක කාර්යයක් බවට පත්ව තිබේ. විශේෂයෙන්ම නගර වෙත ඇදී එන ජනගහණය දිනෙන් දින වර්ධනය වන අතර, වාහන ප්‍රමාණයේද සීඝ්‍ර ඉහළ යාමක් පෙන්නුම් කරයි.

මෙම සංකීර්ණත්වය තුළ රිය අනතුරු අවම කොට සුරක්ෂිත මාර්ග පද්ධතියක් සහතික කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විශාල භෞතික හා මානව සම්පතක් යොදවා තිබේ. කෙසේ වුවද පසුගිය වර්ෂ දෙක හා සංසන්දනය කරන විට 2015 වර්ෂයේ අලාභ අනතුරු හැර අනෙකුත් සෑම වර්ගයකම අනතුරු වල ඉහළ යාමක් පෙන්නුම් කර ඇත. මාරක අනතුරු හා බරපතල අනතුරු වල ඉහළ යාමක් පෙන්නුම් කරන අතර, මාර්ගනීති නොපිළිපැදීම හා රියදුරන් හා පදිකයින්ගේ නොසැලකිලිමත් බව මේ සඳහා ප්‍රබල ලෙස හේතුවී තිබේ. පහත වගුව මගින් රිය අනතුරු පිලිබඳ 2015 වර්ෂයේ තොරතුරු දක්වා ඇත

වගු අංක 13

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | මාරක අනතුරු මරණ සංඛ්‍යාව | වාහන සංඛ්‍යාව | වාහන 1,000කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| **2013** | 2,190 | 6,870 | 13,525 | 15,292 | 37,877 | 2,324 | 5,203,678 | 7 |
| **2014** | 2,261 | 6,847 | 12,950 | 13,992 | 36,050 | 2,436 | 5,633,234 | 6 |
| **2015** | 2590 | 7719 | 13095 | 13514 | 36918 | 2801 | 6,302,141 | 5 |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන කොට්ඨාසය

## 8.1. රිය අනතුරු නිවාරණ වැඩසටහන් ( දැනුවත් කිරීම්)

මාර්ග නීති කඩකරන්නන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන අතර අනතුරු අවම කිරීම සඳහා සෑම සමාජ ස්ථරයක්ම ආවරණය පරිදි පොලිසිය විසින් දැනුවත් කිරීම් සිදු කරනු ලබයි. 2015 වර්ෂයේ සිදු කළ එබඳු දැනුවත් කිරීම් පහත වගුව මගින් නිරූපණය කෙරේ.

වගු අංක 14

| වැඩසටහන | ප්‍රමාණය |
|---|---|
| පාසල් ළමුන් හා රිය නියාමකයින් දැනුවත් කිරීමේ දේශන | 99 |
| රජයේ ආයතන හා නිළධාරීන් හා රියදුරන් දැනුවත් කිරීමේ දේශය | 10 |
| රියදුරන් හා පදිකයින් දැනුවත් කිරීමේ දේශය | 80 |
| ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා දැනුවත් කිරීමේ දේශය | 14 |
| අනාරක්ෂිතව මහා මාර්ග භාවිත කරන පදිකයින් දැනුවත් කිරීම් | 11392 |
| | |

මූලාශ්‍රය - පොලිස් රථවාහන කොට්ඨාසය

# 09. වෙනත් මහජන සේවාවන්

## 9.1. ප්‍රජා පොලිස් ක්‍රියාකාරකම්

පොලිස් දෙපාර්තමේන්තුව මහජනයා වෙත වඩාත් සමීප කරමින් ආරම්භ කරන ලද ප්‍රජා පොලිස් සිවිල් ආරක්ෂක කමිටු ක්‍රියාවලිය අද දක්වා නොමඳ ජනතා ප්‍රසාදයට පත්ව තිබේ. යුධ සමයේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ප්‍රබල භූමිකාවක් ඉටු කළ සිවිල් ආරක්ෂක කමිටු දිවයින පුරා ක්‍රියාත්මකව පවතින අතර, මහජනතාව දැනුවත් කරමින් ගම, නගරය හා රට විවිධ උපද්‍රවයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව සක්‍රියව දායක කරගනිමින් සිටී. පහත වගුව ආශ්‍රයෙන් 2015 වර්ෂයේ ප්‍රජා පොලිස් ක්‍රියාකාරකම් දක්වා ඇත.

වගු අංක 15

| 2015 වර්ෂයේ දැනුවත්කිරීම් සහ ක්‍රියාකාරකම් කොට්ඨාස මට්ටමින් | | |
|---|---|---|
| දැනුවත් කිරීම් | | |
| 1 | ප්‍රජාව දැනුවත් කිරීමේ දේශණ උදා:-අපරාධ/ළමා හිංසන/කාන්තා හිංසන/රථ වාහන/මත් ද්‍රව්‍ය ආදිය | 187411 |
| 2 | ඩෙංගු ඇතුළු බෝවන රෝග පිලිබඳ දැනුවත් කිරීම් | 138963 |
| 3 | පාසල් දරුවන් දැනුවත් කිරීමේ දේශණ උදා:- ළමා හිංසන/ ළමා අපචාර/ නායකත්ව ආදීය | 23456 |
| 4 | පාසැල් හැරගිය දරුවන් (ඉලක්කගත කණ්ඩායම්) වෘත්තීය පුහුනු සඳහා යොමු කිරීමට පවත්වන ලද වැඩමුළු දේශණ ආදිය උදා:-ආධුනිකත්ව මණ්ඩලය/ කාර්මික විද්‍යාලය | 3969 |
| 5 | පාසල් වෑන් රථ රියදුරන්/සහයකයින් දැනුවත් කිරීම | 10173 |
| 6 | බස් රථ/ ත්‍රීවිල් රථ/ ලොරි රථ/ හා අනෙකුත් වාහන රියදුරන්/ කොන්දොස්තරවරුන්/ මගීන් හා පාරිභෝගිකයන් දැනුවත් කිරීම | 25435 |
| 7 | මත් ද්‍රව්‍ය හා මත්පැන් උවදුර දුරු කිරීම සඳහා පවත්වන ලද දැනුවත් කිරීම් | 63988 |
| 8 | වෙනත් දැනුවත් කිරීම් | 30951 |
| | එකතුව | 484346 |
| ක්‍රියාකාරකම් | | |
| 1 | පාසල් දරුවන් අතර කථික තරග/ චිත්‍ර තරග / අනෙකුත් ක්‍රීඩා තරඟ පැවැත්වීම. | 1374 |
| 2 | ප්‍රජා සහභාගිත්වයෙන් උත්සව පැවැත්වීම. උදා:- අවුරුදු උත්සව/ආගමික උත්සව/ ක්‍රිකට්/ අත්පන්දු ආදී ක්‍රීඩා තරඟ පැවැත්වීම | 9926 |
| 3 | ආගම් අතර සහජීවනය ඇති කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන් | 6962 |
| 4 | මං මාවත්/ ලඳු කැලෑ/ පාළු ස්ථාන ආදිය සුද්ද පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන උදා:-ඩෙංගු මර්ධන/ පරිසර පවිත්‍රතා ආදිය පැවත්වීම. | 26884 |
| 5 | ප්‍රජා සේවාවන් (මංමාවත් සැකසීම්/නිවාස තනාදීම් හා වෙනත් | 4027 |
| 6 | සිවිල් ආරක්‍ෂක කමිටු සාමාජිකයන් මගින් සාර්ථක තොරතුරු ලබා ගැනීම | 10672 |
| 7 | වෙනත් ක්‍රියාකාරකම් | 11459 |
| | එකතුව | 71304 |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය



අනාරක්ෂිත දුම්රිය ගේට්ටු පරීක්ෂා කිරීමේ ඡායාරූපයක්



පාසල් දරුවන් දැනුවත් කිරීමේ ඡායාරූපයක්

## 9.2 පරිසර ආරක්ෂණය

සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් තුළින් ශාරීරික හා මානසිකව නිරෝගී ජනතාවක් ගොඩනගා ඒ තුළින් රටේ අනාගතය සුරක්ෂිත කිරීමේ අභිප්‍රාය පෙරටු කරගත් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව පරිසර ආරක්ෂණය විශයෙහි මහත් අවධානයක් යොමු කොට තිබේ. ඒ යටතේ පෙර වර්ෂවල මෙන්ම අඛණ්ඩව 2015 වර්ෂයේද පහත අයුරින් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

- ❖ කොළඹ නගරයේ ඇළ මාර්ග 13 ක් අපවිත්‍ර වීම වළක්වා ගැනීම සඳහා සතියකට එක බැගින් නාවික හමුදාව හා එක්ව බෝට්ටු සංචාර පවත්වා ඇත.
- ❖ නගර අලංකරණය අධීක්ෂණය කිරීම සඳහා යතුරු පැදි සංචාර දිනකට දෙක බැගින් පවත්වා ඇත.
- ❖ 2015.02.13 සිට 2015.12.23 දක්වා ජාතික මදුරු මර්ධන සති පවත්වා දැනුවත් කිරීම්, රතු නිවේදන හා නඩු පැවරීම් සිදු කොට ඇත.


පරිසර ආරක්ෂණය අධීක්ෂණය කිරීම සඳහා පාපැදි ලබා දීම


වෙරළ පවිත්‍ර කිරීමේ අවස්ථාවක්

### 9.3 මහජන පැමිණිලි විසදීමේ සේවාව

පොලිස් ස්ථාන තුළ පැමිණිලි විසදීමේ සීමාවෙන් ඔබ්බට ගොස් වඩාත් ඵලදායීව මහජනතාවට සිය ගැටළු විසදාගැනීමේ වැඩපිළිවෙලක් මෙම ක්‍රමය තුළ ස්ථාපිත කොට ඇත. මේ තුළින් කඩිනමින් හා විශ්වසනීය ලෙස ජනතාවට සිය ගැටළු සඳහා සහන ලබා ගැනීමේ දොරටු විවර කොට ඇත. මේ යටතේ ක්‍රියාත්මක සේවාවන් පහත වගුව මගින් ඉදිරිපත් කොට ඇත.

වගු අංක 16

| පැමිණිලි ලැබීමේ ක්‍රමවේදය | 2015 | |
|---|---|---|
| | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව |
| පොලිස්පති මහජන සහන දිනය | 1055 | 780 |
| 119 හදිසි ඇමතුම් සේවාව | 903245 | 899181 |
| පොලිස්පතිට කියන්න | 2082 | 2019 |
| මහජන සහන මැදිරිය | 1881 | 1429 |

මූලාශ්‍රය - දුක්ගැනවිලි කොට්ඨාසය

### 9.4 පොලිස් මහජන සම්බන්ධතා පිළිබඳ සමීක්ෂණ

පොලිසිය පිළිබඳ මහජන ආකල්ප විමසීමේ සමීක්ෂණය 2011 වසරේ සිට අඛණ්ඩව පවත්වන ලදි. ආසියානු පදනමේ සහාය ඇතිව පොලිස් පර්යේෂණ හා සැළසුම් කොට්ඨාසය මෙම සමීක්ෂණ ක්‍රියාත්මක කරනු ලබයි.

2015 වර්ෂයේ පවත්වන ලද පොලිසිය පිළිබඳ මහජන ආකල්ප විමසීමේ සමීක්ෂණයේදී පහත වගුව මගින් දැක්වෙන සාධනීය කරුණු 2014 වර්ෂයට සාපේක්ෂව අනාවරණය කර ගෙන ඇත.

- ➢ උතුරු, නැගෙනහිර, සබරගමුව හා ඌව පළාත්වල සමාජීය **"ආරක්ෂිත බව"** පිළිබඳ මහජන ආකල්පය 2014 ට සාපේක්ෂව පහත අයුරින් වර්ධනය වී ඇත.

වගු අංක 17

| පළාත | 2014 වර්ෂය | 2015 වර්ෂය |
|---|---|---|
| උතුර | 16% | 24% දක්වා |
| නැගෙනහිර | 24% | 34% දක්වා |
| සබරගමුව | 22% | 35% දක්වා |
| ඌව | 29% | 48% දක්වා |

මුලාශ්‍රය - පර්යේෂණ හා සැලසුම් කොට්ඨාසය

- නැගෙනහිර පළාත තුළ අපරාධයකට ගොදුරු වීමේ හැකියාව 2014 වසරේ 30% ක්වු අතර, මේ වසරේ එය 5 % දක්වා අඩුවී ඇත.
- පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු බව ප්‍රතිචාරකයින්ගෙන් 61% ක් ප්‍රකාශකොට ඇත.
- දකුණු පළාත තුළ පොලිස් මහජන සම්බන්ධතාවය 59% සිට 79% දක්වා වර්ධනය වී ඇත.
- පොලිස් රාජකාරි හා සම්බන්ධ දූෂණය 24% සිට 6% දක්වා අඩුවී ඇති බව සමීක්ෂණය මගින් හෙළිකොට ඇත.
- පොලිස් රාජකාරි සඳහා බාධාකාරි වු දේශපාලන බලපෑම් 56% - 39% දක්වා අඩුවී ඇති බව සමීක්ෂණය මගින් අනාවරණය කොට ඇත.

## 10. මානව සම්පත් සංවර්ධනය

පොලිස් දෙපාර්තමේන්තුව විශාල මානව සම්පතක් සහිතව එම මානව සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ප්‍රධානම දෙපාර්තමේන්තුවකි. නිසි කලට බඳවා ගැනීම් සිදු කොට එම මානව සම්පත වෘත්තීමය දැනුමින් පොහොසත් කිරීම සහ නිසි උසස්වීම් ක්‍රමවේදයක් මගින් සේවා තෘප්තිය වර්ධනය කර එම මානව සම්පතින් පූර්ණ මහජන සේවාවක් ඉටුකර ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුව නිරතුරුව ඇපකැප වී සිටී.

### 10.1 බඳවා ගැනීම්

2015 වර්ෂයේ විශේෂ කාර්ය බලකායද ඇතුළත්ව පොලිස් සේවය සඳහා කරන ලද බඳවා ගැනීම් පහත වගු මගින් දක්වා ඇත.

- **සාමාන්‍ය පොලිස් සේවය**

**වගු අංක 18**

| නිලය | දිනය | බඳවාගත් ප්‍රමාණය |
|---|---|---|
| පොලිස් කොස්ථාපල් (සාමාන්‍ය) | 2015.11.15 | 613 |
| පොලිස් කොස්ථාපල් රියදුරු (සාමාන්‍ය) | 2015.05.18 | 300 |
| පොලිස් කොස්ථාපල් (රාජ්‍ය බද්ධ සේවය) | 2015.04.19 | 82 |
| කාන්තා පොලිස් කොස්ථාපල් (සාමාන්‍ය) | 2015.10.01 | 319 |
| උප පොලිස් පරීක්ෂක (සාමාන්‍ය) | 2015.07.06 | 67 |
| කාන්තා උප පොලිස් පරීක්ෂක (සාමාන්‍ය) | 2015.06.20 | 38 |

මූලාශ්‍රය - බඳවා ගැනීම් කොට්ඨාසය

- **විශේෂ කාර්ය බලකාය**

**වගු අංක 19**

| නිලය | දිනය | බඳවාගත් ප්‍රමාණය |
|---|---|---|
| පොලිස් කොස්ථාපල් (වි.කා.බ.) | 2015.02.14 | 106 |
| උප පොලිස් පරීක්ෂක (වි.කා.බ.) | 2015.06.18 | 55 |
| කාන්තා උප පොලිස් පරීක්ෂක (විකා.බ.) | 2015.06.18 | 04 |

මූලාශ්‍රය - බඳවා ගැනීම් කොට්ඨාසය




පොලිස් සේවයට බඳවා ගැනීමේ අවස්ථා

## 10.2 උසස් කිරීම්

නිසි කලට නිසි උසස්වීම් ක්‍රමවේදයක් යටතේ සියළුම තරාතිරම් සඳහා උසස්වීම් ලබා දීම වෘත්තිය ප්‍රගමනය සඳහා අත්‍යාවශ්‍ය සාධකයකි. ඒ තුළින් තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් ගොඩනැගෙන අතර, ඔවුන්ගේ සේවය උපරිමයෙන් රටේ දියුණුව සඳහා ලබා ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන 2015 වර්ෂයේ පහත පරිදි උසස්වීම් ක්‍රියාත්මක කොට ඇත.

- **සාමාන්‍ය පොලිස් සේවය**

**වගු අංක 20**

| නිළය | සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙ.නි.පො.ප. | 04 |
| නි.පො.ප. | 03 |
| ස.පො.අ. | 02 |
| ප්‍ර.පො.ප. | 128 |
| උ.පො.ප./කා.උ.පො.ප. | 1090 |
| උ.පො.ප./ප්‍රවාහන | 74 |
| **එකතුව** | **1301** |

මූලාශ්‍රය - පිරිස් හා ලේඛන කොට්ඨාසය

- **විශේෂ කාර්ය බලකාය**

**වගු අංක 21**

| | |
|---|---|
| පො.ප./කා.පො.ප. | 93 |
| උ.පො.ප./ප්‍රවාහන | 04 |
| පො.සැ./කා.පො.සැ. | 722 |
| පො.සැ.රි. | 23 |
| **එකතුව** | **842** |

මූලාශ්‍රය - පිරිස් හා ලේඛන කොට්ඨාසය

## 10.3 පුහුණු කිරීම්

පුහුණුව තුළින් වෘත්තියමය නිපුණත්වයෙන් යුත් විනය ගරුක නිළධාරියෙකු බිහිකළ හැකිය, යන්න සනාථ කරමින් පොලිස් දෙපාර්තමේන්තුව විවිධ වූ පෘථුල ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සකස් කරන ලද පාඨමාලා මගින් සිය ශ්‍රම බලකාය දැනුමින් සහ හැකියාවෙන් සන්නද්ධ කිරීමෙහි නිරතව සිටි. මේ වසර තුළ ඒ සඳහා පහත අයුරින් දෙස් විදෙස් පාඨමාලා සඳහා නිළධාරීන් යොමු කර ඇත.

- **දේශීය පුහුණු කිරීම්**

**වගු අංක 22**

**ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය මගින් කළ පුහුණු කිරීම්**

| අනු අංකය | පාඨමාලාව | පාඨමාලා ප්‍රමාණය | පුහුනුව ලැබූ නිලධාරින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු පාඨමාලාව (මූලික පුහුණු) | 5 | 278 |
| 2 | පාලිස් කොස්තාපල් රියදුරු පාඨමාලාව (බරවාහන) | 9 | 215 |
| 3 | ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් තනතුරට හැඩගැස්වීමේ පාඨමාලාව | 2 | 109 |
| 4 | අපරාධ බුද්ධි පාඨමාලාව | 2 | 40 |
| 5 | අපරාධ ස්ථාන පරීක්ෂණ පුහුණු පාඨමාලාව | 2 | 49 |

| | | | |
|---|---|---|---|
| 6 | අපරාධ විමර්ශනය | 1 | 15 |
| 7 | පොලිස් සැරයන් රියදුරු තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුරට උසස් වු නිලධාරීන්ගේ පාඨමාලාව | 2 | 174 |
| 8 | මහජන සාමය කළමණාකරණය කිරීමේ (කැරළි සරඹ) පාඨමාලාව | 2 | 83 |
| 9 | අපරාධ ස්ථාන කළමණාකරණය, පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව | 2 | 49 |
| 10 | පොලිස් නිලධාරීන්ගේ ආකල්ප හා කුසළතා ඉහළ නැංවීමේ පාඨමාලාව | 1 | 48 |
| 11 | අපරාධ විමර්ශනය සහ මත් ද්‍රව්‍ය අපරාධ | 1 | 72 |
| 12 | ධාරිතා සංවර්ධන පාඨමාලාව | 5 | 219 |
| 13 | වැඩබලන පොලිස් සැරයන් පාඨමාලාව | 4 | 280 |
| | **එකතුව** | **38** | **1631** |

මුලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය

වගු අංක 23

**පොලිස් විද්‍යාපීඨය මගින් කළ පුහුණු කිරීම්**

| අ.අ | ඩිප්ලෝමා පාඨමාලා | වර්ෂය තුල පැවැත් වු පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වු නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පොලිස් විද්‍යාව | 1 | 60 |
| 2 | අපරාධ විමර්ශනය | 2 | 77 |
| 3 | විවිධ පැමිණිලි විමර්ශන | 2 | 85 |
| 4 | නඩු මෙහෙයවීම | 2 | 86 |
| 5 | ප්‍රජා පොලිස්කරණය | 1 | |
| | රාජ්‍ය නිවේදිත නිලධාරීන් සඳහා | | 17 |
| | **සහතිකපත් පාඨමාලා** | | |
| 6 | ව්‍යවහාරික විද්‍යාව | 3 | 117 |
| 7 | අධිකරණ වෛද්‍ය විද්‍යාව | 3 | 118 |
| 8 | තාක්ෂණයමත පදනම් වු අපරාධ විමර්ශණ | 3 | 131 |
| 9 | පොලිස් මහජන සම්බන්ධතාවය | 2 | 73 |
| 10 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්කර ගත් ප්‍රචණ්ඩත්වය | 2 | 74 |
| 11 | මානව හිමිකම් | 1 | 43 |
| 12 | පරිගණක අපරාධ | 2 | 79 |
| 13 | වානිජ අපරාධ | 2 | 94 |
| 14 | කළමණාකරණ කුසලතා සංවර්ධනය | 2 | 74 |
| 15 | පාරිසරික නීතිය ක්‍රියාත්මක කිරීම | 2 | 68 |
| 16 | ආයතනික කළමණාකරනය පාඨමාලා | 9 | 217 |
| | මු.පො.ප./ස්ථානාධිපතිවරුන් | | |
| 17 | නායකත්ව ආචාරධර්ම | 4 | 76 |
| | රාජ්‍ය නිවේදිත නිලධාරීන් සඳහා (එක් දින වැඩමුළුව) | | |
| 18 | ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිසිය මගින් පවත්වන ලද අපරාධ බුද්ධි තොරතුරු පිළිබඳ පුහුණු පාඨමාලා | 1 | 23 |
| 19 | ප්‍රජා පොලිස්කරණය පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව | 9 | 248 |
| | **එකතුව** | **53** | **1791** |



මුලාශ්‍රය - පොලිස් විද්‍යා පීඨය

වගු අංක 24

පොලිස් සේවස්ථ පුහුණු ඒකක මගින් කළ පුහුණු කිරීම්

| අනු අං. | වැඩසටහන / ව්‍යාපෘතිය | කාලසීමාව | සහභාගි වූ නිලධාරීන් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | ක්ෂේත්‍රයේ නියුතු කණිෂ්ඨ පොලිස් නිලධාරීන් පුහුණු කිරීම | 2015.01.01 - 2015.12.31 | නිලධාරීන් 26,870 ක් |
| 2 | පුහුණු ඒකකයන්හි පොලිස් පුහුණුකරුවන් පුහුණු කිරීම | 2015.01.01 - 2015.12.31 | පුහුණුකරුවන් 69 ක් |

මූලාශ්‍රය - පොලිස් සේවාස්ථ පුහුණු කොට්ඨාසය

- **විදේශීය පුහුණු**

2015 වර්ෂය තුළ පොලිස් නිලධාරීන් 240 දෙනකු, අවස්ථා 115 කදී විදෙස් පාඨමාලා සම්මන්ත්‍රණ, දේශන සහ වැඩමුළු සඳහා යොමු කර ඇත.

පහත වගුවෙහි දැක්වෙන අයුරින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම සාධක රාජකාරි සඳහා නිළධාරීන් යොමු කොට ඇත.

වගු අංක 25

| නිළය | ප්‍රමාණය |
|---|---|
| ජ්‍යෙ.පො.අ. | 02 |
| ස.පො.අ. | 02 |
| ප්‍ර.පො.ප. | 08 |
| පො.ප. | 11 |
| පො.සැ. | 03 |

මූලාශ්‍රය - පිරිස් හා ලේඛන කොට්ඨාසය







පුහුණු සහ විසිරයැම් අවස්ථා දැක්වෙන ඡායාරූප

## 11. භෞතික සම්පත් සංවර්ධනය

මානව සම්පත් උපයෝගී කර ගෙන ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම සඳහා භෞතික සම්පත් ප්‍රමාණවත්ව සපයා ගත යුතුවේ. පැය 24 පුරාම සේවයෙහි නියුතු ආයතනයක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුව 2015 වර්ෂයේ භෞතික සම්පත ඉතා කාර්යක්ෂමව උපයෝගී කරගනිමින් සිය කාර්යභාරය ඉටුකොට තිබේ. භෞතික සම්පත් සංවර්ධනය සඳහා 2015 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති පහත වගුව මගින් දක්වා ඇත.

- **2015 වර්ෂයේ ඉදිකිරීම්**

**වගු අංක 26**

| අ.අ. | ගොඩනැගිලි වර්ගය | ඉදිකරන ලද ප්‍රමාණය |
|---|---|---|
| 1 | පොලිස් ස්ථාන | 5 |
| 2 | පොලිස් අධිකාරි කාර්යාල | 2 |
| 3 | පෙරසව් ගොඩනැගිලි | 153 |
| 4 | පොලිස් විද්‍යාල/ පොලිස් අභ්‍යාස ආයතන | 1 |
| 5 | සංචාරක බංගලා | 2 |

මූලාශ්‍රය - ගොඩනැගිලි කොට්ඨාසය






විවෘත කිරීමේ අවස්ථා දැක්වෙන ඡායාරූප

## 11.1 අනෙකුත් භෞතික සම්පත් හා සේවා සපයා ගැනීම්.

2015 වර්ෂය තුළ පොලිස් රාජකාරි ඵලදායි ලෙස ඉටුකර ගැනීම සඳහා විශාල පිරිවැයක් දරමින් පහත වගුවේ දක්වා ඇති පරිදි භාණ්ඩ සහ සේවාවන් සපයාගනු ලැබ ඇත.

**වගු අංක 27**

| අනු අංකය | වැය ශීර්ෂ අංකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ කාර්යයන් | 2015 වර්ෂයේ ලද ප්‍රතිපාදන | 2015.12.31 වියදම් (රු. ශ.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 1 | 225-1-2-0-1203- (1) | නිල ඇඳුම් | 549,959,358.00 | 527,368,231.00 | 95.89 |
| 2 | 225-1-2-0-1203- (5) | සත්ව ආහාර | 6,000,000.00 | 5,978,801.00 | 99.65 |
| 3 | 225-1-2-0-1203- (6) | සංග්‍රහ වියදම් | 13,150,642.00 | 13,150,636.00 | 100.00 |
| | | **එකතුව රු.** | **569,110,000.00** | **546,497,668.00** | **96.03** |
| 4 | 225-1-2-0-1205- (5) | ගබඩා උපකරණ | 163,325,000.00 | 129,967,875.00 | 79.58 |
| 5 | 225-1-2-0-1205- (6) | උණ්ඩ | 2,000,000.00 | 890,049.00 | 44.50 |
| 6 | 225-1-2-0-1205- (7) | ඇඟිලි සලකුණු ද්‍රව්‍ය | 7,000,000.00 | 5,104,724.00 | 72.92 |
| 7 | 225-1-2-0-1205- (8) | ඡායා රූප ද්‍රව්‍ය<br>අපරාධ පරීක්ෂණාගාර වලට අවශ්‍ය ද්‍රව්‍ය | 10,000,000.00 | 5,576,379.00 | 55.76 |
| | | **එකතුව රු.** | **182,325,000.00** | **141,539,027.00** | **77.63** |
| 8 | 225-1-2-0-1205- (10) | පුවත්පත් දැන්වීම් සඳහා යන වියදම් | 4,000,000.00 | 3,948,638.00 | 98.72 |
| 9 | 225-1-2-0-1205- (11) | ප්‍රසම්පාදන කමිටු සඳහා යන වියදම් | 1,000,000.00 | 891,672.00 | 89.17 |
| 10 | 225-1-2-0-1508 | රේල් ගේට්ටු ක්‍රියාකරුවන් සඳහා ගෙවීම් | 1,310,000.00 | 1,233,186.00 | 94.14 |
| | | **එකතුව රු.** | **6,310,000.00** | **6,073,496.00** | **96.25** |
| | | **පුනරාවර්තන වියදම් එකතුව රු.** | **757,745,000.00** | **694,110,191.00** | **91.60** |
| | **ප්‍රාග්ධන වියදම්** | | | | |
| 11 | 225-1-2-0-2102- (1) | ගෘහ උපකරණ | 66,600,000.00 | 66,575,877.00 | 99.96 |
| 12 | 225-1-2-0-2102- (2) | පොත්පත් | 3,300,000.00 | 3,282,384.00 | 99.47 |
| 13 | 225-1-2-0-2102- (3) | සුභ සාධන | 6,000,000.00 | 5,932,203.00 | 98.87 |
| 14 | 225-1-2-0-2102- (4) | කාර්යාල උපකරණ | 7,300,000.00 | 7,207,954.00 | 98.74 |
| 15 | 225-1-2-0-2102- (5) | විදුලි උපකරණ | 32,600,000.00 | 32,500,544.00 | 99.69 |
| 16 | 225-1-2-0-2102- (6) | පරිඝනක | 59,200,000.00 | 59,144,466.00 | 99.91 |
| | | **එකතුව රු.** | **175,000,000.00** | **174,643,428.00** | **99.80** |
| 17 | 225-1-2-0-2103- (1) | අවි | 500,000.00 | | - |
| 18 | 225-1-2-0-2103- (2) | ආයිත්තම් | 5,300,000.00 | | - |
| 19 | 225-1-2-0-2103- (3) | ඡායා රූප උපකරණ<br>අපරාධ පරීක්ෂණාගාර වලට අවශ්‍ය උපකරණ | 11,000,000.00 | 10,531,215.00 | 95.74 |
| 20 | 225-1-2-0-2103- (4) | රථ වාහන | 2,000,000.00 | 1,733,540.00 | 86.68 |
| 21 | 225-1-2-0-2103- (5) | ඇඟිලි සලකුණු උපකරණ. | 2,000,000.00 | 1,671,700.00 | 83.59 |
| 22 | 225-1-2-0-2103- (6) | තූර්ය වාදන උපකරණ | 700,000.00 | 682,138.00 | 97.45 |
| 23 | 225-1-2-0-2103- (7) | කැරලි මර්ධන උපකරණ | 500,000.00 | | - |
| 24 | 225-1-2-0-2103- (8) | අශ්වයින් සඳහා අවශ්‍ය උපකරණ | 13,000,000.00 | 12,895,872.00 | 99.20 |
| 25 | 225-1-2-0-2103- (9) | නිල සුනඛයින් සඳහා අවශ්‍ය උපකරණ | 26,500,000.00 | 26,323,330.00 | 99.33 |
| 26 | 225-1-2-0-2103- (17) | වෙනත් උපකරණ | 29,500,000.00 | 28,717,065.00 | 97.35 |
| | | **එකතුව රු.** | **91,000,000.00** | **82,554,860.00** | **90.72** |
| 27 | 225-1-2-0-2502- (1) | නිල සුනඛයින් මිලට ගැනීම | 44,000,000.00 | 43,682,316.00 | 99.28 |
| 28 | 225-1-2-0-2502- (2) | අශ්වයින් මිලට ගැනීම | 56,000,000.00 | 55,673,505.00 | 99.42 |
| 29 | 225-1-2-0-2502 | ගුරුමෝදර පිරිය සඳහා සී.සී.ටී.වී. කැමරා සවිකිරීම | 8,558,168.00 | 5,108,220.00 | 59.69 |
| | | **එකතුව රු.** | **108,558,168.00** | **104,464,041.00** | **96.23** |
| | | **ප්‍රාග්ධන වියදම් එකතුව රු.** | **374,558,168.00** | **361,662,329.00** | **96.56** |
| | | **මුළු එකතුව රු.** | **1,132,303,168.00** | **1,055,772,520.00** | **93.24** |

මූලාශ්‍රය - පොලිස් සැපයුම් කොට්ඨාසය

# 12. සමස්ථ මුල්‍ය ප්‍රගතිය

2015 වර්ෂය තුළ පොලිස් දෙපාර්තමේන්තුවේ සියලු පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් සහ ආදායම් ඇතුළු සමස්ථ මුල්‍ය ප්‍රගතිය පහත වගු මගින් දක්වා ඇත.

- **2015 වර්ෂයේ ආදායම්**

**වගු අංක 28**

| ආදායම් ශීර්ෂය | මුදල රු. |
|---|---|
| 2001.1.0 | 78.330,637.45 |
| 2002.1.1 | 56,200,227.28 |
| 2002.2.99 | 86,286,715.23 |
| 2003.2.99 | 109,138,480.59 |
| 2003.4.0 | 321,138,480.70 |
| 2003.99.0 | 59,470,880.21 |
| 2004.1.0 | 884,256,084.62 |
| 2006.2.0 | 4,089,214.92 |

මුලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පොලිස් මුලස්ථානය

- **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**

**වගු අංක 29**

| ගිණුමේ නම | ගිණුම් අංකය | දෙපාර්තමේන්තු පොත් අනුව | | | |
|---|---|---|---|---|---|
| | | 2015.01.01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හරකිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | 2015.12.31 දිනට අවසන් ශේෂය |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | | රු | රු | රු | රු |
| | 225011 | 2,355,021,056.96 | 1,005,077,497.22 | 1,609,108,767.42 | 1,750,989,756.76 |
| | 225012 | | 34,601,445.98 | 25,880,651.43 | 8,720,794.55 |
| | | 2,355,021,056.96 | 1,039,678,943.20 | 1,634,989,418.85 | 1,759,710,581.31 |
| සීමාවන් | | | උපරිම හර සීමාව | අවම බැර සීමාව | උපරිම හර ශේෂ සීමාව |
| රුපියල් | | | 1,687,075,000.00 | 1,387,075,000.00 | 4,000,000,000.00 |

මුලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පොලිස් මුලස්ථානය

- **පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්**

**වගු අංක 30**

| ආයතනය | 2015 වර්ෂයේ සංශෝධිත ප්‍රතිපාදන ප්‍රමාණය | | 2015.12.31 ට මුලු වියදම | | කාර්ය සාධන ( % ) | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්ථන | ප්‍රාග්ධන | පුනරාවර්ථන | ප්‍රාග්ධන | පුනරාවර්ථන | ප්‍රාග්ධන |
| ශ්‍රී ලංකා පොලිසිය | 52,329,150,000.00 | 5,539,790,000.00 | 51,343,698,854.00 | 2,280,320,360.00 | 98 % | 52 % |

මුලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පොලිස් මුලස්ථානය

## 13. 2015 වර්ෂයේ කාර්ය සාධනය සැකෙවින්

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ කාර්යසාධනය විවිධ අංශ යටතේ ඉහළගොස් ඇති අතර, ඇතැම් අංශවල පෙර මට්ටම පවත්වාගෙන ඇත. එමෙන්ම සුළු පසුබැම් වලටද ලක්වී ඇති බව පිළිගත යුතුය.

- බල අපරාධ වාර්තා වීම 21.14% කින් අඩුකර ගැනිමට හැකිවී ඇති අතර, සංඛ්‍යාත්මකව එය 10774 ක අඩුවීමකි.
- විවිධ පැමිණිලි සංඛ්‍යාව සැළකියයුතු ලෙස අඩුවී ඇති අතර, 2014 ට සාපේක්ෂව එය 50830 ක අඩුවීමකි. එහි විසඳීම් ප්‍රතිශතය 99.7% සිට 99.9% දක්වා වර්ධනය වී ඇත.
- ළමයින්ට එරෙහි අපරාධ වල සුළු ඉහළ යාමක් පෙන්නුම් කළද එහි විසඳීමේ ප්‍රතිශතය 28% සිට 86% දක්වා ප්‍රශස්ථ මට්ටමකට වර්ධනය කොට ඇත.
- කාන්තාවන්ට එරෙහි අපරාධ පෙර වසරට සාපේක්ෂව අඩුවී ඇති අතර, විසඳීමේ ප්‍රතිශතයද වර්ධනය වී ඇත.
- නිරන්තර හා නිවැරදි තොරතුරු මත සිදුකළ වැටලීම්වල ප්‍රතිඵලයක් ලෙස අත් අඩංගුවට පත් මත්ද්‍රව්‍ය ප්‍රමාණයද ඉහළ ගොස් ඇත.
- පොලිසිය පිළිබද මහජන ආකල්ප විමසීමේ සමීක්ෂණයට අනුව ජනතාවගේ “සමාජ ආරක්ෂිත බව” පිළිබඳ හැගීම ඉහළ මට්ටමකට ගෙන ඒමට පොලීසිය සමත්ව ඇත.
- පොලිස් මහජන සම්බන්ධතාවය ඇතැම් පළාත් වල 59% සිට 79% දක්වා වර්ධනය වී ඇති අතර අපරාධයකට ගොදුරුවීමේ හැකියාව 30% සිට 5% දක්වා අඩුකර ගැනිමට සමත්ව ඇත.
- විශාල මානව හා භෞතික සම්පතක් යොදවමින් රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව වෙනුවෙන් පොලිසිය මහත් පරිශ්‍රමයක් දරනු ලැබුවද රිය අනතුරු වල වර්ධනයක් පෙන්නුම් කිරීම තරමක පසුබෑමක් ලෙස සැලකිය හැකි අතර රථ වාහන ප්‍රමාණය ඉහළ යාම, රියදුරන්ගේ හා පදිකයින්ගේ නොසැළකිලිමත් භාවයද මේ සඳහා ප්‍රබල ලෙස හේතුවී ඇත.